රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

## ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ I ශ්‍රේණියේ අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුරට පත්කිරීම සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදනය

තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුරේ පුරප්පාඩු 01ක් පවතින අතර, එම පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි 2019.09.12 දිනැතිව නිකුත් කරනු ලැබූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2019 හි ඇමුණුම 02 අනුව සකස් කරනු ලැබූ අයදුම්පත්‍රයක් 2024.08.07 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ dgitm@itmd.treasury.gov.lk යන විද්‍යුත් තැපෑලෙන් හෝ අතින් තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්පත යොමු කරන ලිපි කවරයෙහි වම්පස ඉහළ කෙලවරේ "ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ අධ්‍යක්ෂ තනතුර සඳහා ඉල්ලුම්පත "ලෙස සඳහන් කළ යුතුය.

**අයදුම්පත් එවිය යුතු ලිපිනය**
**අධ්‍යක්ෂ ජනරාල්**
**තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව**
**කාමර අංක 27**
**මහලේකම් කාර්යාලය**
**කොළඹ - 01**

03. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2050/43 හා 2017.12.22 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුරට පත් කරනු ලැබේ.

I. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේ පිළිවෙල පහත දක්වා ඇත.

**ලකුණු දීමේ පටිපාටිය**

| | පරීක්ෂා කර ලකුණු ලබා දෙන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01 | **සේවා පළපුරුද්ද - 60**<br>I. තනතුරට අදාළ ශ්‍රේණියේ සක්‍රිය හා සතුටුදායක සේවා කාලය<br>➢ වසරක් සඳහා - ලකුණු 05 බැගින්<br>➢ වසරකට අඩු මාස 06කට වඩා වැඩි කාලසීමාවක් - ලකුණු 02 ½ බැගින් දෙනු ලැබේ.<br>➢ මාස 06කට වඩා අඩු සේවා කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. | 50 |
| | II. ආයතනයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවශ්‍යතාවයට (නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ ලෙස) අදාළ පූර්ව පළපුරුද්ද (උපරිම වසර 05ක් සඳහා) වෙනුවෙන් | 10 |

| | | |
|---|---|---|
| | ➢ වසරක් සඳහා - ලකුණු 02 බැගින්<br>➢ වසරකට අඩු මාස 06කට වඩා වැඩි කාලසීමාවක් - ලකුණු 01 බැගින් ලබා දෙනු ලැබේ.<br>➢ මාස 06කට වඩා අඩු සේවා කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. | |
| 02 | **කුසලතාවය - 40**<br><br>**I.** අධ්‍යාපන සුදුසුකම්<br><br>අ) පද්ධති විශ්ලේෂණය (System Analysis), පද්ධති සැලසුම්කරණ (System Designing), තොරතුරු තාක්ෂණ අවශ්‍යතා විශ්ලේෂණය (Requirement Analysis), තොරතුරු තාක්ෂණ දත්ත පද්ධති කළමනාකරණ (Database Management), පරිගණක ජාල ආරක්ෂණ (Computer Network Security) සම්බන්ධ පශ්චාත් උපාධියක් සඳහා - ලකුණු 15<br><br>(ආ) ඉහත (අ) හි විස්තර කර ඇති ක්ෂේත්‍ර සම්බන්ධ පශ්චාත් උපාධි ඩිප්ලෝමා - ලකුණු 10<br><br>**"ලබා ඇති ඉහලම සුදුසුකම සඳහා ලකුණු දෙනු ලැබේ."** | 15 |
| | **II.** වෘත්තිය සුදුසුකම්<br><br>(අ) (I) තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ විශේෂයෙන් තොරතුරු පද්ධති (IS), තොරතුරු තාක්ෂණ (IT) හෝ පරිගණක ජාල/ ආරක්ෂණ (Computer Networks / Security ) ක්ෂේත්‍රවලට අදාළව ලබා ඇති අවම වශයෙන් වසරක් හෝ ඊට වැඩි කාලයක් සහිත ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා - ලකුණු 10<br><br>(II) එම ක්ෂේත්‍රයේ මාස 06ක් හෝ ඊට වැඩි වසරකට අඩු පාඨමාලා සඳහා - ලකුණු 05<br><br>"මෙම කොටස සඳහා (I) හා (II) කාණ්ඩ දෙක යටතේම ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව ලකුණු 10 කි" | 10 |
| | **III.** විශේෂ කාර්යයන්/දායකත්වයන්<br><br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළව සිදු කරන ලද නව නිර්මාණ, වැඩිදියුණු කිරීම හා ජයග්‍රහණ, ත්‍යාග, ප්‍රශංසා සඳහා මේ යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>(අ) නව නිර්මාණ, වැඩිදියුණු කිරීම්, ජයග්‍රහණ හෝ ත්‍යාග සඳහා එකකට ලකුණු 02 බැගින් උපරිම අංග 05ක් සඳහා - ලකුණු 10<br><br>(ආ) පොදු 230b ආකෘතියෙන් ඉදිරිපත් කර ඇති අමාත්‍යාංශ ලේකම්/ආයතන ප්‍රධානියා විසින් සහතික කළ ප්‍රශංසා 01ක් සඳහා ලකුණු 01 බැගින් උපරිම ප්‍රශංසා 05ක් සඳහා පමණක් එනම්, උපරිම ලකුණු 05ක් පමණක් ලබා දෙනු ලැබේ.<br><br>සැ.යු.<br><br>❖ නව නිර්මාණ, වැඩිදියුණු කිරීම් අයදුම්කරු විසින්ම සිදු කළ බවට ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. | **10** |

| | | |
|---|---|---|
| | ❖ ත්‍යාග හා ජයග්‍රහණ අයදුම්කරු විසින් ලබා ගත් බවට විධිමත් සහතික පත්‍ර ඉදිරිපත් කළ යුතුය.<br>"මෙම කොටස සඳහා (අ) හා (ආ) කාණ්ඩ දෙක යටතේම ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව ලකුණු 10 කි" | |
| | **IV. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය**<br><br>අ.) නායකත්වය - ලකුණු 02<br>ආ.) සන්නිවේදනය කුසලතාවය - ලකුණු 02<br>ඇ.) වෘත්තීය ආචාරශීලීභාවය - ලකුණු 01 | **05** |

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි ,

දිනය 2024/07/22


රවින්ද්‍ර පත්මප්‍රිය
අධ්‍යක්ෂ ජනරාල්
තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

දුරකථන අංකය - 011- 2484861
ෆැක්ස් අංකය - 011 - 2421219
විද්‍යුත් ලිපිනය - dgitm@itmd.treasury.gov.lk